# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2169/3 - 2020 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් 2020.04.02 දින සිට මාස 3ක කාලයක් සඳහා,

i. 2017.11.17 දිනැති, අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද, 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල I වන උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන් හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා කරන ගෙවීම්, පහත බැහැර කිරීම් හැර (එවැනි අවශ්‍යතාවයන් පිළිබඳ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වේ නම් පමණක්) අත්හිටවනු ලැබේ.

   *අ.* විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන ;

   හෝ

   *ආ.* ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන ආයෝජන ;

ii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ හැර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටවනු ලැබේ ;

iii. 2017.11.17 දිනැති අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල IV වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරය යටතේ දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම අත්හිටවනු ලැබේ ;

iv. සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ඇ.එ.ජ. ඩොලර් 30,000ක උපරිමය දක්වා සීමා කරනු ලැබේ ;

v. 2017.11.17 දිනැති අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් නිවේදනවල* පළ කරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු) නියෝගවල I වන උපලේඛනයෙහි ප්‍රදනය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවල දී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7 (10) වගන්තිය ප්‍රකාරව අවසර ප්‍රදනය කිරීමෙහි අධිකාරිය මුදල් මණ්ඩලය සතු වේ ඃ

*අ.* විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම ;

හෝ

*ආ.* ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජන සිදු කිරීම.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 02 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.